**2026-02-10 බළන්ගොඩ ප්‍රාදේශිය සභා**
**මාසික මහා සභා රැස්වීමේ**
**සංක්ෂිප්ත වාර්තාව**

2026 පෙබරවාරි මස 10 වන දින පෙ.ව.10.00ට බළන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

**සහභාගිත්වය :**

1. ගරු සභාපති - ගමඇතිගේ ආරියදාස මැතිතුමා
2. ගරු උපසභාපති - බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.බී.ගුණරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.රෝහණ ජගත් වීරසේකර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.යූ.සී.තිලක් වික්‍රමසිංහ මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.ඉන්දික කරුණාරත්න මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.නන්දසිරි මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.සමන් කුමාර මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.නිශාන්ත කිත්සිරි මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මුදිත ප්‍රසාද් මල්ලිකාරත්න මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එම්.ඩබ්.ලක්රුවනි සමරනායක මැතිනිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.කේ.අජිත් ප්‍රියන්ත මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එම්.ආර්.නයනජිත් හේමාල් මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ඩබ්.දර්මදාස මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ.ඩබ්.ජගත් නිලන්ත කුමාර මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමි
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.එම්.වජිරා ගීතානි වීරසේන මැතිනිය
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.පී.චන්ද්‍රාණි නන්දරත්න මැතිනිය
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ශ්‍රියානි මැතිනිය
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.කේ.ඩී.රෝෂන් ක්‍රිස්ටි මැතිතුමා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එන්.විමලසේන දිසානායක මැතිතුමා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩී.ඉඳුනිල් ප්‍රියන්ත මැතිතුමා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩබ්.අනුර ක්‍රිෂාන්ත් බස්නායක මැතිතුමා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.රෝහණ පුෂ්පකුමාර මැතිතුමා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ටී.කුසුම්සිරි අලංකාර මැතිතුමා
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.කේ.දහම් ගුණසේකර මැතිතුමා
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ජී.දනුෂ්ක සමන්ත කුමාර මැතිතුමා
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.සී.ඉන්ද්‍රානි ගුණසිංහ මැතිනිය

**සහභාගි නොවූ :-**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.අසෝක්කුමාර් මැතිතුමා
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය

**01.පසුගිය සභා වාර්තාව සම්මත කිරීම**

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
අපිට න්‍යාය පත්‍රයේ මුලින්ම තියෙන්නේ පසුගිය ජනවාරි මස මහා සභා වාර්තාව සම්මත කිරීම. ගරු මන්ත්‍රීතුමෙක් හෝ තුමියෙක් ඉදිරිපත් වෙලා එම වාර්තාව සභා සම්මත කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය**
පසුගිය කාර්මික කමිටුවේ මගේ නම වෙනුවට ධම්මිකා ජයශීලි මන්ත්‍රීතුමියගේ නම සඳහන් කරලා තියෙන්නේ. ඒක ඩී.බී.එන්.දීපශිකා පෙරේරා කියලා සංශෝධනය වෙන්න ඕනි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.නන්දසිරි මැතිතුමා.**
එම සංශෝධනයටත්ට යටත්ව පසුගිය සභා වාර්තාව සම්මත කිරීමේ යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව පසුගිය මස මහා සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බව මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**02.සභාපතිවරයා විසින් සභාවට ඉදිරිපත් කළ යුතු නිවේදන**
මෙවර සභාවට ඉදිරිපත් කළ යුතු කරුණු කිහිපයක් තියෙනවා. එකක් තමයි අපි විශාල ආපදාවකට මුහුණපාපු රටක් විදියට අපි නැවත වැටිච්ච අපේ රට ගොඩ ගන්න ඕනි. ඒ වෙනුවෙන් හැම ග්‍රාම සේවක වසමකම රාජ්‍ය යාන්ත්‍රණයක් ගොඩනගලා තියෙනවා. ඒකට ඉදිරි කාලයේදී පනතක් මගින් මේකට තියෙන නීතිමය තහවුරුව ගේනවා. ඒක තමයි ප්‍රජා සංවර්ධන සභාව. දැනට තියෙන්නේ ප්‍රජා ශක්ති කමිටුව කියලා. දැනට ඒ තියෙන ප්‍රජා ශක්ති කමිටුවට වසමට සම්බන්ධ වෙලා ඉන්න රාජ්‍ය නිළධාරින් සියළු දෙනාම සම්බන්ධ වෙලා ඉන්නවා. ඒක දේශපාලන යාන්ත්‍රණයක් නෙවෙයි. ඒ ප්‍රජා ශක්ති කමිටුව කියලා කියන්නේ දේශපාලන කමිටුවක් නෙවෙයි. ඒක රාජ්‍ය ව්‍යුහය. ඒ කමිටුවේ නිළ බලයෙන්ම ලේකම් බවට පත්වෙන්නේ වසමට සම්බන්ධ සංවර්ධන නිළධාරි. ඊට පස්සේ ඒ අයට අපි පත්වීම් දීලා තියෙනවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී. සභාපති විදියට පත්වීම් ලැබුවේ, මමත් සම්බන්ධ වුණා ඒ පත්වීම් ලබා දෙන්න, අදාළ කොට්ඨාශය ජයග්‍රහණය කරපු මන්ත්‍රීවරයා හෝ මන්ත්‍රීවරිය එසේ නැත්තම් යම් කිසි වටිනාමක් තියෙන , රාජ්‍ය නිළධාරින් එක්ක ගණුදෙනු කළ හැකි පුද්ගලයෙක් ඒකට නම් කරලා තියෙනවා. ඒක නිසා මින් ඉදිරියට සංවර්ධන යෝජනා දෙනකොට ඒ වගේම සභාවටත් යෝජනා ඉදිරිපත් කරන කොට සංවර්ධනය පැත්තෙන්, ඒ ප්‍රජා ශක්ති කමිටුවෙන් එන යෝජනාම තමයි අපිට ගන්න කියලා කිව්වේ. ගරු ආණ්ඩුකාරතුමියට වෙනම සංවර්ධන යෝජනා මෙහෙන් යවලා තිබුණා , අතේ අරන් ගියපු ඒවත් තිබුණා , හැබැයි මින් ඉදිරියට සංවර්ධන වැඩ කරනකොට ඒවා කරන්නේ ඒ ග්‍රාමීය කමිටුවෙන් ඒ කියන්නේ ප්‍රජා ශක්ති කමිටුවේ යෝජනා විතරයි ගන්නේ. ඒකට හේතුව තමයි එහෙම නැතිවුණොත් මෙතන දේශපාලන භේදයක් එනවා. ඒ දේශපාලන භේදයකින් තොරව මේ වැඩේ කර ගන්න ඕන නිසා තමයි මොකද අපේ ගම් හදන්න ඕන, අපේ පාරවල් ටික හදන්න ඕන, හොඳ ග්‍රාමීය පාරවල් හදන්න ඕන, ඒක නිසා දැන් අපිට දේශපාලනයක් නැහැ අපි දැන් එක මිටට එකතු වෙලා අපි සියළු දෙනාම අපේ රට ගොඩ ගන්න ඕන. අපට පක්ෂ තිබුණා. දැන් අපි පක්ෂ විපක්ෂ නැහැ. විශේෂයෙන්ම අපේ සභාව ගත්තත් , පළාත් පාලන ආයතන ගත්තත් අපේ පක්ෂවලින් තමයි නියෝජිතයන් තේරී පත් වෙන්නේ. නමුත් මෙතනට ආවට පස්සේ අපි පක්ෂ විදියට නම් කරන්නෙත් නැහැ. මං බොහෝවිට නම් කරන්නේ මගේ දකුණු අත පැත්තේ කණ්ඩායම සහ මගේ වම් අත පැත්තේ කණ්ඩායම කියලා. පක්ෂ විපක්ෂ නැහැ. අපි ඔක්කොම සහිකයින්. අපි එක හා සමානව තමයි ඒ අය දිහා බලන්නේ. ඒක නිසා තමයි අර ප්‍රජා ශක්ති කමිටුව හරහාම අපි යෝජනා ගන්නවා ඒ අනුමත වෙච්ච යෝජනා ගන්නේ. ඒ යෝජනා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තියෙන්නේ, ග්‍රාමීය සංවර්ධන සැලැස්ම අන්න ඒකෙන් තමයි අපි යෝජනා ගන්නේ. ඒක නිසා අපි ඒ යෝජනා පමණක්ම දෙන්න කියලා අපේ මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියන්ලාට ඉල්ලීමක් කරනවා ඒ සඳහා දැනුවත් වෙන්න කියලා.

ඒ වගේම අපිට අපේ සභාව , අපි ඇත්තටම අනිත් සභාවල්වලට ආදර්ශයක්. මං ඒක ඉහළ සාකච්ඡාවල්වලදිත් කියපු දේ තමයි බලන්ගොඩ ප්‍රාදේශීය සභාව ගත්තොත් අපි ලොකු ආදර්ශයක් දීලා තියෙනවා. ඒ නිසා අපි සභාවේ පෞද්ගලික අදහස් ඉදිරිපත් කිරීම ගත්තොත් ඒ පෞද්ගලික අදහස් ඉදිරිපත් කිරීමට මං අහපු විදියට , මං පළාත් පාලන ආයතනවල මීට කලින් ඉඳලා නැහැ බලන්ගොඩ ප්‍රාදේශීය සභාවෙත් න්‍යාය පත්‍රයේ ඉඩක් තිබිලා නැහැ. ඒකත් අපිට මේ සැරේ කිව්වේ අවශ්‍ය නම් දාන්න කියලා. හැබැයි අපි ඉදිරිපත් කරපු දේ තමයි අපේ නවක මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා ඉන්නවා. ඒ අයගේ අදහස් ඉදිරිපත් කරන්න ඕන. ඒ අයට යම් අදහස් ඉදිරිපත් කිරීමේ පුහුණුවකුත් තියෙන්න ඕනි. ඒක නිසා මින් පස්සේ අපේ ක්‍රියාවළියේ තියෙන්නේ මුලින්ම ප්‍රාදේශීය සභාවට එන්න ඕනි, ඊට පස්සේ පළාත් සභා යන්න ඕනි, පළාත් සභාවෙන් ඊට පස්සේ යන්න ඕනි පාර්ලිමේන්තුවට. පාර්ලිමේන්තුවෙනුත් එහාට යන්න පුළුවන් නම් ඒත් හොඳයි නේද. දැන් අපේ බස්නායක මන්ත්‍රීතුමා එහෙම ඉන්නේ පාර්ලිමේන්තුවෙනුත් එහාට යන්න. එතෙන්දි ඒක නිසා අපිට අපි න්‍යාය පත්‍රයට ඒක ඇතුළත් කළා පෞද්ලික අදහස් ඉදිරිපත් කිරීම කියලා. මෙතන පක්ෂ විපක්ෂ භේදයක් නැති නිසාම , අපිට කාලය දීර්ඝ කර ගන්න බැරි නිසාම , අපි මගේ දකුණු අත පැත්තේ කණ්ඩායමේ තුන්දෙනෙක්ට විනාඩි 03 ගානේ , ඊට පස්සේ මගේ වම් අත පැත්තේ කණ්ඩායමටත් විනාඩි 03 ගානේ තුන්දෙනෙක්ට අවස්ථාව දෙනවා. ඇත්තටම මේක ප්‍රමාණවත් නෑ කියලා නිකන් හිතෙනවා. විශේෂයෙන්ම දකුණු අත පැත්තේ කණ්ඩායම එකතු වෙච්ච වෙලාවක සාකච්ඡා කළා අදහසක් ඉදිරිපත් කළා ඒ අයට හැම දෙනාම කතා කරන්න ඕනි. හැම දෙනාම කතා කරන්න ඕනි නිසාම ගියවර කතා කරපු අය මේවර කතා කරන්න බැහැ. අලුත් අය කතා කරන්න. දැන් මෙතන පිරිස වැඩි නිසාම සමහර අය කියනවා එයාට කතා කරන්න ඕනි නැහැ කියලා. මේකේ පෞද්ගලික අදහස්නේ ඉදිරිපත් කරන්න තියෙන්නේ. ඒක නිසා කිසි කෙනෙක් මේකට වෙන අදහසක් හිතන්න එපා අපිට විනාඩි 03 මදි කියලා අපිට ඒ ගාණ තමයි දෙන්න වෙන්නේ මොකද අපිට සභාව දීර්ඝ කරගන්න බැරි නිසා. අනිත් එක තමයි අපි මේ න්‍යාය පත්‍රය පළාත් සභාවට යවනවා. ඒගොල්ලෝ සැලකිල්ලට ගන්නේ යෝජනා ටික. එතකොට අපේ පෞද්ගලික අදහස් දැක්වීම වැදගත් වෙන්නේ මෙතනට විතරයි. පක්ෂ විපක්ෂ වලින් ආවට අපි මන්ත්‍රීවරු. අපි මන්ත්‍රීවරුන් සහ වරියන් විදියට අපේ අදහස් ඉදිරිපත් කරන්නේ කොයිබටද . අන්න ඒක නිසා අපි ඒකට ඉඩක් හදලා තියෙනවා සභාව ඇතුළේ. එකක් තමයි අපේ කාරක සභා, ඒ කාරක සභා අවස්ථාවන් තියෙනවා ඒ කාරක සභා අවස්ථාවල අපිට අවස්ථාව තියෙනවා අපේ අදහස් ඉදිරිපත් කරන්න. ඊට පස්සේ අපිට යෝජනා කරන්න පුළුවන්කමක් තියෙනවනම් අපේ නීතිරීති යටතේ ඒවට එකඟ වෙමින්, ඒවට යටත් වෙමින් අපිට ඒකාබද්ධ කාරක සභාවක් ගන්න පුළුවන්කමක් අපි හදා ගත්තොත් අපිට පුළුවන් අපේ අදහස් ඉදිරිපත් කරන්න ටිකක් පුළුල්ව. ඒක නිසා අපි එහෙම හදාගමු. ඒ විදියට අපි අලුත්විදියට අලුත් වර්ෂයේ අපි මේ සභාව ඉතාමත් ආදර්ශමත් සභාවක් බවට පත් කරගන්න අපි සියළු දෙනාටම ශක්තිය ධෛර්යය ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරමින් මගේ කතාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

- ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.වජීරා ගීතානි වීරසේන මැතිනිය පෙ.ව.10.10 ට සභා රැස්වීම සඳහා පැමිණෙන ලදී.

**03.සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
අසනීප තත්ත්වයේ පසුවන නිසා අද දින සභා රැස්වීමට සම්බන්ධ වෙන්න විදියක් නැහැ කියලා ප්‍රීතිකා නිලන්ති වීරවංශ මැතිනිය නිවාඩු ඉල්ලුම් කරලා ලිපියක් සභාගත කරලා තියෙනවා. එතුමියගේ නිවාඩු අනුමත කරලා දෙන්න කියලා මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.සී.ඉන්ද්‍රානි ගුණසිංහ මැතිනිය**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
ඒ වගේම අපේ ගරු අසෝක්කුමාර් මන්ත්‍රීතුමාට අද සභාවට පැමිණෙන්න විදියක් නැහැ කියලා නිවාඩු ඉල්ලුම් කරපු ලිපියක් සභාගත කරලා තියෙනවා. එතුමාගේ නිවාඩු අනුමත කරලා දෙන්න කියලා මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.සමන් කුමාර මැතිතුමා**
මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

- ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනියගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.අසෝක්කුමාර් මැතිතුමාගේ නිවාඩු සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**04.මාසිකව සභාවට ලැබී ඇති ලියුම් ,පෙත්සම්,පැමිණිලි,සංදේශ හා නිවේදන ඉදිරිපත් කිරීම**
ඉදිරිපත් වී නැත

**05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** - ඉදිරිපත් වි නැත.

**06. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**06-01 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ගොඩනැගිලි සංවර්ධන අයදුම්පත්‍රයේ කාලය දීර්ඝ කිරීම සඳහා අය කරනු ලබන ගාස්තුව පිළිබඳ තීරණය කිරීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමියන් විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
මේ යෝජනාවේ තියෙන්නේ අපේ ගොඩනැගිලි සැලසුම් කරනකොට අපි ගොඩනැගිලි සංවර්ධන අයදුම්පත්‍රයේ කාලය විදියට අවුරුද්දයි ලබා දෙන්නේ. අවුරුද්දට වැඩිය දීර්ඝ කර ගත්තොත් අපිට නැවත අය කිරීමක් කරන්න වෙනවා සභාවට. ඒ කියන්නේ අයදුම්පත්‍රය අලුත් කරන්න. මේ යෝජනාව සැලසුම් කමිටුවට ආවා. අපේ සැලසුම් කමිටුව තිබුණේ 2026-01-07 වන දින. මේ පැවති සැලසුම් කමිටුවේදී තීරණය වුණා ඒ අය කරන මුදල පිළිබඳව තීරණය කරන්න. ඒ මුදල තීරණය කරන්න සාකච්ඡා කර ගත්තේ වෙනත් සභාවල ගන්න මුදලුත් එක්ක. විශේෂයෙන්ම වැලිගෙපොල ප්‍රාදේශීය සභාව රු.500/= ක් ගන්නවා. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ රු.2500/=ක් ගන්නවා. යූඩී එකෙන් 5000/=ක් ගන්නවා. මෙන්න මේකත් සැලකිල්ලට අරගෙන අපිට මේ මුදල තීරණය කරන්න ඕනි. ඒකට සභාවට බලය තියෙනවා. ඊට පස්සේ නාගරික සංවර්ධන අධිකාරියට යටත්ව තියෙන වසම්වල රු.5000/=ක් අය කරනවා. ඒක පනතෙන්මයි එන්නේ. දැන් අපේ බළන්ගොඩ ප්‍රාදේශීය සභාව ගත්තොත් නගර සභා සීමාවේ තියෙන ග්‍රාම සේවක වසම් තියෙනවා නාගරික සංවර්ධන අධිකාරිය යටතේ තියෙන. විශේෂයෙන්ම කිරිමැටිතැන්න සහ විකිළිය ඒවයෙත් රු. 5000/=යි. අන්න ඒවා හැර ඉතුරු ඒවට තමයි අපි මේ ගාණ තීරණය කරන්න ඕනි. අන්න ඒ නිසා මේකට මුදලුත් එක්ක යෝජනා කරන්න. මොකද යෝජනා කරලා අපි මේක සම්මත කර ගන්න ඕනි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.සමන් කුමාර මැතිතුමා**
මම යෝජනා කරනවා රු.2500/=ක් වගෙ මුදලක් අය කරන එක සුදුසුයි කියලා.

- ඒ අනුව 2026 වර්ෂයේ සිට ගොඩනැගිලි සංවර්ධන අයදුම්පත්‍රයේ වලංගු කාලය දීර්ඝ කිරීම සඳහා රු.2500/=ක මුදලක් අය කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

**06-02 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන 2026 වර්ෂය සඳහා සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී සහ පෝෂණ ඌණතාවයෙන් පෙළෙන දරුවන් සඳහා පෝෂණ මල්ලක් ලබා දීමට අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩබ්.අනුර ක්‍රිෂාන්ත් බස්නායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

මේ යෝජනාව තියෙන්නේ මෙහෙමයි. දැනට අපි දරුවන් 10 දෙනෙක් තෝරගෙන ඉන්නවා. මාස ගණන 04යි. අවශ්‍ය ආහාර මලු ගණන 40යි. ඒ ආහාර මල්ලක මිල රු.2500.00 යි. අපි මේ අවුරුද්දට මේකට වෙන් කරලා තියෙනවා රුපියල් 10000.00ක මුදලක්. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ තමයි මේකට බලය පැවරිලා තියෙන්නේ. සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයෙන් තමයි මේ අඩු පෝෂණ සහිත දරුවන් තෝරලා දෙන්නේ. ඒ අනුව තමයි මේක ක්‍රියාත්මක වෙන්නේ. අපි මේකට අනුමැතිය ගන්න ආපසු ආණ්ඩුකාරතුමියට ඉදිරිපත් කරන්නත් ඕනි. ඒ නිසා මේ කාර්යය සිදු කරන්න අපිට මේ ගරු සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

- ඒ අනුව 2026 වර්ෂයට අදාළව උග්‍ර අඩු පෝෂණ ඌණතාවයෙන් පෙළෙන දරුවන් 10 දෙනෙකු සඳහා එක් අයෙකුට මසකට රුපියල් 2500/=ක් වන පෝෂණ මලු 10ක් බැගින්, මාස 04ක කාලයක් රු.100000/=ක් වටිනා පෝෂණ මලු 40ක් ලබා දීම සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා, අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

### 06-03 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන 2026 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුව සඳහා සාමාජිකයන් පත් කර ගැනීම සම්බන්ධ යෝජනාව

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

මේකෙදි විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය පිළිබඳ නම් කරලා අපිට පළාත් පාලන කොමසාරිස් උපදෙස් 2/2018/14 සහ 2018-10-19 දින ලිපියෙන් දැනුවත් කරලා තියෙනවා. ඒකට අනුව තමයි අපි මේ කමිටුවට සාමාජිකයන් පත් කරන්න ඕනි. මං ඒ ලිපියේ සඳහන් කමිටු සංයුතිය ඉස්සෙල්ලාම ඉදිරිපත් කරන්නම්.

01.පළාත් පාලන ආයතනයේ සභාපති - කමිටු සභාපති
02.පළාත් පාලන ආයතනයේ ලේකම් - කමිටු ලේකම්
03.පළාත් පාලන ආයතනයේ ගිණුම් නිළධාරි - සාමාජික
04.පළාත් පාලන ආයතනයේ ප්‍රධාන ආදායම් පරීක්ෂක - කමිටු සාමාජික
05.විගණන විෂය භාර නිළධාරි - කමිටු සාමාජික
06.පළාත් පාලන ආයතනයේ අංශ ප්‍රධානින් - කමිටු සාමාජිකයින්
07.වෙනත් අවශ්‍ය නිළධාරින් - කමිටු සාමාජිකයින්
08.ප්‍රජා සංවර්ධන නිළධාරි/විමර්ශන නිළධාරි - කමිටු නිරීක්ෂක
09.සබරගමු පළාත් අභ්‍යන්තර විගණන නිළධාරි - කමිටු නිරීක්ෂක
10.විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිළධාරින්- කමිටු නිරීක්ෂක
11.වෙනත් අවශ්‍ය නිළධාරින් - කමිටු නිරීක්ෂක

දැන් ඒ අනුව අපේ සභාව නියෝජනය කරමින් පත් කරලා තියෙන කමිටුවේ සංයුතිය මං ඉදිරිපත් කරන්නම්.

01.පළාත් පාලන ආයතනයේ සභාපති - කමිටු සභාපති
ගමඇතිගේආරියදාස මැතිතුමා
02. පළාත් පාලන ආයතනයේ ලේකම් - කමිටුලේකම්
ජී.කේ.ආර්.එන්.ප්‍රේමරත්න මිය
03.පළාත් පාලන ආයතනයේ ගිණුම් නිළධාරි - සාමාජික

ඩබ්.කේ.එල්.එස්.වන්නිආරච්චි මයා
04.විගණන විෂය භාර නිළධාරි - කමිටු සාමාජික
ඩබ්.ඩී.චන්ද්‍රිකා මිය
05.පළාත් පාලන ආයතනයේ අංශ ප්‍රධානින් - කමිටු සාමාජිකයින්
ඩී.ජී.ජේ.කේ.ජයවර්ධන මහතා
06.වෙනත් අවශ්‍ය නිළධාරින් - කමිටු සාමාජිකයින්
පී.කේ.උදයංගනී මිය /ඩබ්.යූ.ඩී.කේ.පියදාස මිය
07.ප්‍රජා සංවර්ධන නිළධාරි/විමර්ශන නිළධාරි - කමිටු නිරීක්ෂක
08.සබරගමු පළාත් අභ්‍යන්තර විගණන නිළධාරි - කමිටු නිරීක්ෂක
09.විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිළධාරින්- කමිටු නිරීක්ෂක
10.වෙනත් අවශ්‍ය නිළධාරින් - කමිටු නිරීක්ෂක
ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා - ප්‍රා. සභා මන්ත්‍රී

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමි</u>**

සභාපතිතුමා ඕකට විපක්ෂෙන් කවුරුත් නැද්ද. අවස්ථාවක් දෙන්න පුළුවන්කමක් තියෙනවනම් ලබා දෙන්න.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

හරි එහෙනම් නමක් යෝජනා කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, විගණන හා කළමනාකරණ කමිටුවට විපක්ෂය නියෝජනය කරමින් මලිත් මන්ත්‍රීතුමාව යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.සී.ඉන්ද්‍රානි ගුණසිංහ මැතිනිය</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව ප.ප.කො. උපදෙස් 2/2018/14 හා 2018-10-19 දිනැති ලිපිය මගින් දක්වා ඇති කමිටු සංයුතියට අනුව කමිටු සාමාජිකයන් පහත පරිදි පත් කිරීමටත්,

01.පළාත් පාලන ආයතනයේ සභාපති - කමිටු සභාපති
ගමඇතිගේආරියදාස මැතිතුමා
02. පළාත් පාලන ආයතනයේ ලේකම් - කමිටුලේකම්
ජී.කේ.ආර්.එන්.ප්‍රේමරත්න මිය
03.පළාත් පාලන ආයතනයේ ගිණුම් නිළධාරි - සාමාජික
ඩබ්.කේ.එල්.එස්.වන්නිආරච්චි මයා
04.විගණන විෂය භාර නිළධාරි - කමිටු සාමාජික
ඩබ්.ඩී.චන්ද්‍රිකා මිය
05.පළාත් පාලන ආයතනයේ අංශ ප්‍රධානින් - කමිටු සාමාජික
ඩී.ජී.ජේ.කේ.ජයවර්ධන මහතා
06.වෙනත් අවශ්‍ය නිළධාරින් - කමිටු සාමාජිකයින්
පී.කේ.උදයංගනී මිය /ඩබ්.යූ.ඩී.කේ.පියදාස මිය
07.ප්‍රජා සංවර්ධන නිළධාරි/විමර්ශන නිළධාරි - කමිටු නිරීක්ෂක
08.සබරගමු පළාත් අභ්‍යන්තර විගණන නිළධාරි - කමිටු නිරීක්ෂක
09.විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිළධාරින්- කමිටු නිරීක්ෂක
10.වෙනත් අවශ්‍ය නිළධාරින් - කමිටු නිරීක්ෂක
ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා - ප්‍රා. සභා මන්ත්‍රී
ඊ.එම්.ආර්.එම්.ජයසේන මැතිතුමා - ප්‍රා.සභා මන්ත්‍රී

මෙම කමිටු සාමාජිකයන් ගේ ස්ථාන මාරුවීමක් හෝ විෂය හුවමාරුවක් සිදුවන අවස්ථාවකදී ඊට අනුරූප වන පරිදි කමිටු සංයුතියට නව සාමාජිකයන් ගැලපීමටත් අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-04 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන 2025-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට , වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට , අපහරණ හා වෙන්දේසි කටයුතු සිදු කිරීමට අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමියන් විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>

2025-12-31 දිනට අදාළව සිදු කරපු භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මේ වෙනකොට අවසන් කරලා තියෙනවා. එතකොට මේකේ සඳහන් කරලා තියෙන නිර්දේශ ක්‍රියාත්මක කරන්නත්, අපහරණ හා වෙන්දේසි කටයුතු සිදු කරන්නත් සභාවේ අනුමැතියක් අවශ්‍ය වෙනවා. මේ තියෙන්නේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව. ලොකු පොතක්. මේ පිළිබඳව වැඩිමනක් දැන ගන්න ඕනි නම් හැමකෙනෙකුටම අවස්ථාව තියෙනවා මේක පරිශීලනය කරන්න.

- ඒ අනුව 2025-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට සහ එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දීමටත්, අපහරණ හා වෙන්දේසි කටයුතු විධිමත් ක්‍රමවේදයන්ට අනුගතව සිදුකිරීමට අනුමැතිය ලබා දීමටත්, මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-05 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන මැද්දෙකන්ද තිරිවානා කැනීම් ව්‍යාපෘතියට ප්‍රවේශ වීම සඳහා ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග කොටසක් ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.රෝහණ ජගත් වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>

මේ යෝජනාවේ තියෙන ඒ කැනීම් කරන පාරේ අපට අහුවෙන්නේ අඩි 12ක වගේ ප්‍රමාණයක්. ඊට පස්සේ අපි ඇප මුදලක් විදියට තියාගන්නවා රු.100000/=ක මුදලක්. අඩි 12 ක වගේ පොඩි පටියක් පාර හරහා යන්නේ. අපි කොන්දේසිවලට යටත්ව තමයි මේක ලබා දෙන්නේ. ඊට පස්සේ අපිට දැන් ආරංචි වුණා මේ යෝජනාව මේ න්‍යාය පත්‍රය දාලා තියෙද්දිත් එයා වාහන ගත්තා කියලා. පස්සේ අපි හොයලා බලනකොට එක වාහනයක් අරගෙන තියෙනවා ලෑලි දාලා අරන් තියෙන්නේ. සාමාන්‍යයෙන් අපිට කියන්නේ එහෙමනේ එකක් ගියත් 10ක් ගියා කියලා. නමුත් මේක නිෂ්පාදන ක්‍රියාවලියක් නිසාම මෙහෙම ඒවට අපිට අවසර දෙන්න සිද්ධ වෙනවා. රටට අදායම ගලාගෙන එන එකක්නේ. එහෙම කියලා පාරවල්වලට , පරිසරයට හානි කරන්නත් බැහැ. නමුත් අපි අපේ කොන්දේසිවලට යටත්ව අවසරය දෙන්න ඕනි. මේක අපේ කාර්මික නිළධාරිත් දෙන්න නිර්දේශ කරලා තියෙනවා. හැබැයි අපි අවසරය දෙන්නේ මොනවහරි වුණොත් ඒක හදන්න කොන්දේසි පනවලා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමි.**</u>

සභාපතිතුමනි, ඒ ලක්ෂය ආපහු දෙන එකක්ද. එතකොට මේකෙන් අපේ සභාවට යම් කිසි මුදලක් ලැබෙනවද. මොකද සභාවේ පාරක් පාවිච්චි කරන නිසා යම් මුදලක් අය කරන්න පුළුවන් නම් සුදුසුයිනේ.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
ඒ රුපියල් ලක්ෂේ කියන්නේ ඇපකරයක්. මේක ආපහු දෙන එකක්. මේ හාමුදුරුවෝ ඉදිරිපත් කරන යෝජනාවත් අපි සැළකිල්ලට ගමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.එම්.ජයසේන මැතිතුමා</u>**
සභාපතිතුමා, මං හිතන්නේ ජගත් මන්ත්‍රීතුමත් දන්නවා, මැද්දෙකන්ද වතුයායට අයිති ඉඩමක තමයි ඔය කැනීම් කටයුතු කරන්නේ. එතකොට ටෙන්ඩර් දාලා ඔය වතු සමාගමට අයිති සියලු ආකාරයේ ගෙවීම් ඒ ප්‍රජෙක්ට් එක කරගෙන යන ව්‍යාපාරිකයා විසින් ගෙවලා තියෙනවා. එතකොට සභාවේ අයිති ඉඩමකින් මාර්ගය සකස් කරලා ප්‍රවාහන කටයුතු කිරීමේදී විශාල මුදලක් නෙවෙයි යම් සැළකිය යුතු මුදලක් අපේ සභාවට අය කර ගන්න පුළුවන් නම් හොඳයි කියලා මම අදහස් කළේ. මොකද සියලු ගාස්තු ගෙවලා ව්‍යාපාරයක් කරනවා, ලාභයක් ලබනවා.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
හරි අපි ඒ අදහස් සැළකිල්ලට ගමු.

- ඒ අනුව කාර්මික නිළධාරි නිර්දේශය මත මැද්දෙකන්ද තිරිවානාකැනීම් ව්‍යාපෘතියට ප්‍රවේශ වීම සඳහා බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් තිරිවනාගල්ගොඩ මාර්ගයෙන් අඩි 10 – 0 පළල ප්‍රමාණයක් රු.100000/=ක ඇප තැන්පතුවක් රඳවා ගෙන ගිවිසුමකට යටත්ව ලබා දීම සඳහා අනුමැතිය ලබාදීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-06 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන වෙළිඹය ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කාමර 08 සඳහා 2023 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි වසර 30ක කාලයක් දක්වා දිගු කාලීන බදු දීමට අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.කේ.ඩබ්.ජගත් නිලන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
මේ යෝජනාවේ තියෙන මේ කඩ කාමර 08 පළාත් පාලන කොමසාරිස්ගේ 03/2020 කියන චක්‍රෙල්ඛය අනුවයි , 2022-10-06 දිනැති තක්සේරු වාර්තාවට අනුවයි , 2022-10-20 මහා සභාවේ තීරණ අංක 05-02 අනුවයි මේ වන කොට දිගු කාලීනව බදු දීලා තියෙන්නේ. එතකොට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුව කාඩ කාමර දිගු කාලීනව බදු දෙනකොට විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගන්න ඕනි. දැන් නම් විෂය භාර අමාත්‍යවරයා වෙනුවට ඉන්නේ ආණ්ඩුකාරතුමිය. නමුත් යම් අතපසු වීමක් හේතුවෙන් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගන්න නොහැකි වෙලා තියෙනවා. එතකොට මේ කඩ කාමර බදු දෙනකොට විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගන්න ඕනි එසේත් නැත්තම් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගන්න ඕනි. නමුත් ඒ මොහොතේ මේ අවසරය අරගෙන නැහැ. හැබැයි අපට පහුවෙලා හරි මේ අවසරය ගන්න වෙලා තියෙනවා. මොකද නීත්‍යානුකූලව යන්න ඕනි නිසා. එතකොට 2022 මේක අරගෙන නෑ. එතෙන්දි දැන් අපිට වෙනවා ඒක නිවැරදි කරන්න. ඒකට අපේ සභාවෙන් සම්මත කරලා අපි ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට දාන්න ඕනි සම්මත කර ගන්න. නැත්තම් අපි නීතියට එකඟව වැඩ කරලා නැහැ. ඒ වගේම 2025 මූල්‍ය කාර්ය සාධන වාර්තාවෙත් අපට පෙන්නලා දීලා තියෙනවා මේක නිවැරදි කරගන්න කියලා.

- ඒ අනුව වෙළිඔය ආර්ථික මධ්‍යස්ථානයේ කඩ කාමර 08 ප.පා.කො.03/2020 චක්‍රලේඛය අනුව, 2023 වර්ෂයේ සිට වසර 30 ක කාලයකට දිගු කාලීනව බදු දීම සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා දීම සඳහා මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-07 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන මාර්ග ආරක්ෂාව සඳහා දොරවෙල ඔයේ වැලිපරය ඉවත් කිරීමට සභාව සතු** ZA -5174 JCB **යන්ත්‍රය යොදා ගැනීමට අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ඉන්දික කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

මේකට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තමයි අපෙන් ඉල්ලීමක් කළේ. ඒ සඳහා අවශ්‍ය කරන සියළුම නිර්දේශ ටිකත් මේ මොහොත වෙනකොට ලැබිලා තියෙන්නේ. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සමීක්ෂණ වාර්තාව තමයි මේ තියෙන්නේ. ඊළගට මේ පිළිබඳව ඒකාබද්ධ පරීක්ෂණයක් තිබ්බා. මේ ඒකාබද්ධ පරීක්ෂණයට මේ විෂය සම්බන්ධ සියලුම නිළධාරින් සම්බන්ධ වුණා. ප්‍රාදේශීය සභාවෙන් මේකට මමත්, විෂය භාර නිළධාරිත් සම්බන්ධ වුණා. ඇත්තටම ඉතාම අවදානම් තත්ත්වයේ ඒක තියෙන්නේ. ඒ ගඟ ගැලුවට පස්සේ සම්පූර්ණයෙන්ම යන්නේ පාරෙන්. වැඩිපුර වැස්ස එන්නේ අප්‍රේල් මාසේ. අප්‍රේල් මාසේ වෙනකොට වැස්ස ආවොත් සම්පූර්ණයෙන්ම ඒ පාරට විශාල හානියක් වෙනවා. එහෙම වුණොත් අපිට විශාල මුදලක් වියදම් කරන්න වෙනවා මේ පාර හදන්න. ඒ නිසා අපිට මේකට සභාවේ අනුමැතිය ලබා ගන්න වෙනවා. මේ පිළිබඳව ඉන්දික මන්ත්‍රීතුමත් දන්නවා. මොකද විශේෂයෙන්ම මේක බලපාන්නේ ඉන්දික මන්ත්‍රීතුමාට.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා**

සභාපතිතුමා, මේක පොඩ්ඩක් විස්තර කළොත් නේද. වැලි ටිකට මොකක්ද කරන්නේ. ඒ කියන්නේ අපි සභාවෙන් මොනවද කරන්නේ කියලා.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

පසුයි, වැලියි කවලම් වෙලා තියෙන්නේ. ඒක කපලා ගඟ කෙලින් කරන්න ඕනි. ඒ පස් ටික දානවා මේ පැත්තට. අපි ඒකාබද්ධ පරීක්ෂණයේදී තීන්දු කළා මේ පස් කොහෙටවත් ප්‍රවාහනය කරන්න බැහැ කියලා. මොදක ඒවා අර හේදිලා ගියපු පාර අයිනටම දාන්න ඕනි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ඉන්දික කරුණාරත්න මැතිතුමා**

ඔතන කලින් ගඟ කෙලින් ආවා. පාරත් තිබුණා අඩි 12ක ප්‍රමාණයක්. ඊට පස්සේ ගිය අවුරුද්දේ කොස් ගහක් තිබිලා ඒක කඩා ගෙන වැටිලා ගඟ හරස් වුණා. දැන් ගඟ **Z** අකුරේ හැඩේට තමයි යන්නේ. දැන් වතුරපාර ඇවිල්ලා වදින්නේ පාරේ. දැන් මේ සැරේ මේක හැදුවෙ නැතොත් ඊළඟ වැස්සට පාරත් එක්ක හෝදගෙන යනවා. එහෙම වුණොත් එහෙම මේ පාර නැවත යථා තත්ත්වයට පත් කරන්න විශාල මුදලක් වියදම් කරන්න වෙනවා. ඊට වැඩිය හොඳයි තිබ්බොත් ගඟ කෙලින් කරන එක. අර පස් ටික කපලා මේ පැත්තට ගන්නවා.

- ඒ අනුව දොරවෙල ඔයෙහි වැලි සංචිතය ගොඩගැසී මාර්ගයේ ආරක්ෂාවට හානියක් සිදුවිය හැකි බැවින් , කඩිනම් හා අත්‍යාවශ්‍ය කරුණක් ලෙස සළකා සභාව සතු ZA -5174 JCB යන්ත්‍රය මෙම වැලිපරය ඉවත් කිරීමේ කටයුතු සඳහා කාර්මික නිළධාරි නිර්දේශය අනුව පැය 20ක කාලයකට ලබා දීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**07. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
2025 ජනවාරි මස මුදල් කමිටු වාර්තාව ගරු සභාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කරනවා.

7.1 මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව

- සභාව විසින් සළකා බලන ලදී.

**08. ලැබීම් වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ , එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
2025 ජනවාරි මාසයට අදාළ ලැබීම් වියදම් පිළිබඳ මාසික ප්‍රකාශය සහ එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව ගරු සභාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කරනවා.

- සභාව විසින් සළකා බලන ලදී.

**09.සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා</u>**
අපේ කොට්ඨාශයේ මහජන ආරක්ෂක කමිටුව කියලා එකක් පත් කළා. ඊට පස්සේ අයි.ඩී.එකට කියලා අපිට ෆොටෝ ගේන්න කිව්වා. අපි කට්ටිය 36 ක් 37ක් විතර හිටියා. අපි කට්ටියම ෆොටෝ ටික භාර දීලා ඒ ෆෝම් ටිකත් පුරවලා දුන්නා. දුන්නට පස්සේ ගිය මාසේ 29 වෙනිදා ආයේ කෝල් කරලා කිව්වා ෆොටෝ ගන්න ඕනි ඒකට ඔගොල්ලෝ රුපියල් 500/= කුත් අරන් එන්න කියලා පොලීසියට. ඇත්තටම සමහර කට්ටියට සල්ලි නෑ ඒ වෙලාවේ. අපි පොලීසියට ගිහිල්ලා රුපියල් 500/=කුත් දීලා ආයේ ෆොටෝ ගන්න අර කලින් දීපු ෆොටෝ ටිකට මොනවද වුණේ කියලා අපි දන්නෙත් නැහැ. මේ ස්වෙච්ඡාවෙන් වැඩ කරන්න එන කට්ටිය රු.500/=කුත් දීලා ආයෙත් පොලීසියටත් සල්ලි දීලා එහෙම කරන්න ඕනි නැහැනේ. මහජන පොලිස් කමිටුව කියන්නේ එතනට එන්නේ ස්වෙච්චාවෙන් වැඩ කරන අයනේ. එතකොට ගමේ එක්කෙනෙක් ඉන්නවා උස්වත් කියලා. එතකොට එයාත් මේකේ ඉන්නවා. නමුත් එදා මට කියනවා මම පොලීසියට ගියාට පස්සේ මට සල්ලි තිබුණෙත් නෑ රුපියල් 500/=ක් , ඒත් සල්ලි ඉල්ලුවා ඊට පස්සේ එහා පැත්තේ හිටපු එක්කෙනෙක්ගෙන් සල්ලි ඉල්ලලා දුන්නා කියලා කිව්වා. ඉතින් මෙයා මගෙන් අහනවා ගියපාර දීපු ෆොටෝ ටිකට මොකද වුණේ කියලයි, ආයේ ආයේ ෆොටෝ ගන්නේ ඇයි කියලයි. ඒක පොලීසියෙන් කරන වැඩක්ද එහෙම නැත්තම් පොලීසියේ ඉන්නවා බෝපිටිය මහත්තයා කියලා එක්කෙනෙක් එයාගේ වැඩක්ද දන්නේ නෑ කියලා එගොල්ලෝ කියනවා. සභාපතිතුමනි, ඒ ගැන පොඩ්ඩක් හොයලා බලන්න ඕනි.

සභාපතිතුමනි, තව එකක් තියෙනවා අර ගම්වලට ප්‍රජා කමිටුව කියලා එකක් පත් කරලා යෝජනා දෙනවනේ. එතකොට ඒ යෝජනා දෙන්න ඕනි විපක්ෂෙයි ආණ්ඩු පක්ෂෙයි ඔක්කොම එතනටද දෙන්න ඕනි.

**<u>ගරු සභාපති ගම ඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
ඒකේ නම ප්‍රජා ශක්ති කමිටුව. නමුත් අර පාර්ලිමේන්තුවේ පනතක් මගින් ගේනවා ඔක ප්‍රජා සංවර්ධන සභාව කියලා. ඒ ප්‍රජා සංවර්ධන සභාවට තමයි යෝජනා ගන්නේ. රාජ්‍ය නිළධාරින් සියලු දෙනාම ඕකේ ඉන්නවනේ. ඒකට තමයි අපි පොදුවේ යෝජනා ඔක්කොම ගන්නේ. ඒ යෝජනාවලින් තමයි ග්‍රාමීය සංවර්ධන සැලැස්ම හදන්නේ එතනින්. ග්‍රාමීය සංවර්ධන සැලැස්ම හදනකොට අපි එකක් තියෙනවනේ පළාත් සභාවෙන්, දැන් මෙතන ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා දන්නවා අපිට පළාත් පාලන ආයතනයක් විදියට ලොකු වියදම් කරන්න බැහැ. අපි යැපෙන්නේ පළාත් සභාවත් එක්කනේ. අපිට පළාත් සභාවෙන් එනවනේ හදිසි යෝජනා. එතකොට හදිසි යෝජනා එනකොට අපි බොහෝදුරට ගන්නේ , අපිට ගන්න කියලා තියෙන්නේ අන්න අර ප්‍රජා ශක්ති කමිටුවෙන් නිර්දේශිත

යෝජනා. අන්න ඒ ප්‍රජා ශක්ති කමිටුවට මන්ත්‍රීතුමන්ලාට සහ තුමියන්ලාට සියලු දෙනාටමත් තම තමන්ගේ වසම්වලින් ඒ ප්‍රජා ශක්ති කමිටුවට සම්බන්ධ වෙන්න පුළුවන්. සම්බන්ධ වෙලා යෝජනා දෙන්න අවස්ථාව තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා**

එතකොට සභාපතිතුමා එතන ආණ්ඩු පක්ෂෙ විපක්ෂෙ කියලා එකක් තියෙනවද. එතකොට ඕක ප්‍රජා සංවර්ධන කියලා නම් කරලා තියෙන්නේ කවුද.

**ගරු සභාපති ගම ඇතිගේ ආරියදාස මැතිතුමා**

එතන ආණ්ඩු පක්ෂෙ විපක්ෂෙ කියලා එකක් ඇත්තෙම නෑ එතන. වසමේ ඉන්න සංවර්ධන නිළධාරි හම්බ වෙලා ඔය තොරතුරු ටික සියල්ලම ගන්න පුළුවන්. ඒ කියන්නේ කමිටුව රැස්වෙන දිනෙත් ගන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමන්ලාට සහ තුමියන්ලාට වාඩි වෙන්නත් පුළුවන්. උප සභාපතිතුමා ඔබතුමා සභාපති කෙනෙක් පොඩ්ඩක් මේක පැහැදිලි කරන්න.

**ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා**

සම්බන්ධ වීමක් වෙන්න බැහැ කමිටුවට. සභාපති විසින් නම් කරන පිරිසක්නේ ඉන්නේ. නමුත් එතන රාජ්‍ය නිළධාරින් 04 දෙනාම ඉන්නවා. සංවර්ධන නිළධාරිතුමා තමයි ඒකේ ප්‍රධාන කාර්යය භාරය කරන්නේ. එතුමා හෝ එතුමිය හම්බ වෙලා ඔබතුමන්ලා සතුව තියෙන සියළුම යෝජනා ටික ඒ හරහා කමිටුවට එවා ගන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා**

එතකොට මන්ත්‍රීලාට සහභාගි වෙන්න බැහැ. සංවර්ධන නිළධාරිතුමාගේ නිර්දේශය අරගෙන එතුමා හරහා කමිටුවට එවනවා. එතකොට සංවර්ධන නිළධාරිතුමා තමයි තීරණය කරන්නේ මේ සංවර්ධන වැඩේ කරනවා කියලා.

**ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා**

එතකොට සංවර්ධන නිළධාරිතුමා ඒ අදාළ කමිටුවට ඒ ටික අරගෙන එනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා**

එතකොට මන්ත්‍රීතුමා දුන්නා කියලා එතනට එන්නේ නැහැ. දැන් මම මන්ත්‍රීතුමා නම් මගේ දෙහිගස්තලාව කොට්ඨාශයේ තියෙන සංවර්ධන යෝජනා ටික මගේ නමින් එන්නේ නැහැ. එතකොට මේ සභාවට ගෙනල්ලා අපිට සංවර්ධන යෝජනා ටික දෙන්න බැරිද.

**ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා**

නැහැ මෙහෙමයි වෙන්නේ. ප්‍රජා සංවර්ධන කමිටුවට ඒ යෝජනා ටික දුන්නම එතන අනුමැතියක් සහිතව අදාළ වසමට අදාළ ප්‍රජා සංවිධානය නමින් මෙතනට එනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.දනුෂ්ක සමන්ත කුමාර මැතිතුමා**

පොඩ්ඩක් පැහැදිලි කරනවද ඇයි විපක්ෂෙ මන්ත්‍රීවරුන්ට මෙතනට සහභාගි වෙන්න බැරි කියලා.

**ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා**

දැන් මේක හදලා තියෙන්නේ ප්‍රදේශයේ සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයා විසින් නම් කරන ලද එකක්නේ ඔතන තියෙන්නේ. එතකොට ප්‍රජා ශක්ති එකේ සභාපති වෙන්නේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන පාර්ශවයෙන් තමයි සභාපති නියෝජනය වෙන්නේ. මේක හදලා තියෙන්නේ මෙන්න මෙහෙම ප්‍රදේශයේ සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයා නම් කරන කෙනා තමයි ඒකේ සභාපතිවරයා වෙන්නේ. එතකොට ඒකේ තියෙනවා ව්‍යුහයක්. මං හිතන්නේ එදා පැහැදිලි කළා ඕක පැහැදිලිවම.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

හරි හරි පොඩ්ඩක් ඉන්න. ඒ කියන්නේ මෙහෙමයි. මගේ ඔෆිස් එකේ තිනෙවා මේකේ සම්පූර්ණ සැලැස්ම. ගරු මන්ත්‍රීතුමන්ලාට සහ තුමියන්ලාට ඒක බලා ගන්න පුළුවන්. මං උදාහරණයක් කියන්නම් දහමාන වසමේ ප්‍රජා ශක්ති කමිටුවේ සභාපති දහමාන මන්ත්‍රී නෙවෙයි. මන්ත්‍රීලා 03ක් ඉන්නවා. ඒ එක්කෙනෙක්වත් නැහැ. ඒකේ ඉන්නේ වෙන කෙනෙක්. දැන් අපි පත්වීම් දීලා

තියෙනවා. ඒ පත්වීම් ලබපු කෙනා තමයි ඒකේ සභාපති වෙන්නේ. ඉතින් දැන් ප්‍රශ්නයක් තියෙනවා මගේ වම් අත පැත්තේ ඉන්නෙත් ගම් නියෝජනය කරන අය. කොච්චර පක්ෂ නැහැ කිව්වත් පක්ෂයක් තියෙනවනේ. එතකොට පක්ෂවලින් එන මන්ත්‍රීවරු කියන්නේ මහජන නියෝජිතයෝ. එතකොට ඒ අයටත් මෙතනට එන්න අවස්ථාවක් තියෙන්න ඕනි කියලා තමයි මෙතනින් මේ කියන්නේ. එතෙන්දි අපි මෙහෙම කරමු. අපි ඕක සාකච්ඡාවක් විදියට කරමු.

හරි අපි නීති රීති වලින් පොඩ්ඩක් පිට වීමක් වුණා. දැන් අපිට මේ දීලා තියෙන රීතින්වල තියෙනවා පෞද්ගලික අදහස් ඉදිරිපත් කරන කොට ඒකට වෙන මන්ත්‍රීවරුන්ට අදහස් දක්වන්න බැහැ කියලා. ඒ නිසා අපි ඒ පිළිබඳව සැළකිල්ලට ගන්නම්. මං ඒක විශේෂයෙන්ම සැළකිල්ලට ගන්නම්, අපේ ඉන්න මන්ත්‍රීවරුන්ට සහ මන්ත්‍රීවරියන්ට ඒගොල්ලොත් මහජන නියෝජිතයෝ, දැන් ප්‍රජා ශක්ති සංවර්ධන සභාව නමින්ම ඒක ගම්වල ගොඩ නැගෙද්දි ඒක නිසාම ඇත්තටම අවස්ථාවක් තියෙන්න ඕනි ඒ සියළු දෙනාටත් මෙතනට සම්බන්ධ වෙන්න. ඒ නිසා අපි ඒ පිළිබඳව සැළකිල්ලක් දක්වන්නම්.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මුදිත ප්‍රසාද් මල්ලිකාරත්න මැතිතුමා</u>**
ගරු සභාපතිතුමනි, සභාවෙන් අවසරයි, ඇත්තටම මං කතා කරන්නේ පහුගිය දිනෙක සභාවට ආසන්න ඉස්කෝලෙක සංගීත සංදර්ශනයක් පැවැත්වුවා. ඒකට සභාවේ අනුමැතිය අරගෙන කොහොමද පැවැත්වුවේ කියලා දැන ගන්න කැමතියි. මං අදහසක් ඉදිරිපත් කරන්නේ. මොකද ඒ සංගීත සංදර්ශනය තියලා ඒගොල්ලන්ගේ වැඩේ ඉවර වෙලා ඒ අය සම්පූර්ණයෙන් බඩු ටික අස් කරගෙන යනවා. ඉස්කෝලේ පිට්ටනියවත්, පාරවත් කිසිම දෙයක් සුද්ධ පවිත්‍ර කිරීමක් කරලා නැහැ. සෙනසුරාදා තිබුණු සංගීත සංදර්ශනය ඉවර වෙලා මං දැන් ඊයේ එතනට ගිහිල්ලා බලනකොට මත්පැන් බීපු බෝතල්, බියර් ටින්, අරක්කු බීපු කප් ඒවා ඔක්කොම ග්‍රවුන්ඩ් එකෙයි, පාරෙයි හැමතැනම දාලා ගිහිල්ලා තිබුණා. මං පොඩි අදහසක් ඉදිරිපත් කරන්නම් මේවා තියනකොට යම්කිසි මුදලක් රදව ගන්න, රදවගෙන මේ වැඩේ අවසන් කරලා ඉවර වුණාට පස්සේ මේක සුද්ධ පවිත්‍ර කරලා අවසන් කරලා දුන්නොත් විතරක් මේ රැඳවුම් මුදල නිදහස් කරලා දෙනවා කියන මතයේ ඉන්න ක්‍රමයක් හදා ගන්න. ඊයේ උදේ මං බලාගෙන ඉස්කෝලේ ආපු ළමයි 04 දෙනෙක් තමයි ඉස්කෝලේ ග්‍රවුන්ඩ් එක සුද්ධ කරන්නේ. ඒගොල්ලෝ සංගීත සංදර්ශනයක් තියලා, ඒගොල්ලන්ගේ මුදල හොයාගෙන, එගොල්ලෝ ගමෙන් බැහැරට ගියාට පස්සේ පාසල් ළමයි දාලා ඉස්කොලේ සුද්ධ කරන්න නම් සංගීත සංදර්ශන තියන්න ඕනි නැහැ. සතුටු වෙන්න ක්‍රමයක් වගේම මේකේදී ඉස්කෝලේ ගැනත් හිතන්න ඕනි. මොකද එකක් මගේ වසම, අනික මමත් ගිය ඉස්කොලේ. මම කලාප කාර්යාලයටත් මේ ගැන කතා කරලා කිව්වා. කලාප කාර්යාලයෙන් කිව්වා රත්නපුරෙන් තමයි මේකට අනුමැතිය ලැබිලා තියෙන්නේ කියලා. ඉදිරියේදී මේ වගේ දෙයක් කරනවනම් අනිවාර්යයයෙන්ම රැඳවුම් මුදලක් තියාගෙන, ලක්ෂෙක හරි කමක් නැහැ රැඳවුම් මුදලක් තියාගෙන, ඉස්කොලේ වැඩේ ඉවර කරලා ඊට පස්සේ ඉස්කෝලේ සුද්ධ පවිත්‍ර කළාට පස්සේ ඒ රැඳවුම් මුදල නිදහස් කරන්න. මොකද ඉස්කෝලේ වෙලාවේ කවුරුත් විනාශ කරලා දාපු ඒවා සුද්ධ කරන්න ඉස්කොලේ ළමයි දාන්න ඕනි නෑ. මොකද එගොල්ලෝ ඉස්කොලේ යන්නේ අධ්‍යාපනය ලබන්න මිසක් කවුරුත් කාපු බීපු ඒවා සුද්ධ කරන්න නෙවෙයි. ළමයිට දකින්න බැරි විදියේ රෙදි පාර අයිනේ දාලා ගිහිල්ලා තිබුණා. හරිම අසෝබන සිද්ධියක්. ඒ නිසා ඉදිරියේදී මේවාට මොනව හරි ක්‍රියාමාර්ගයක් අර ගත්තොත් හොඳයි කියලා හිතනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩී.ඉඳුනිල් ප්‍රියන්ත මැතිතුමා</u>**
ගරු සභාපතිතුමනි, අපේ සහෝදර මන්ත්‍රීතුමනි, මන්ත්‍රීතුමියනි, මාධ්‍යවේදී සියළු දෙනාගෙන්ම අවසරයි. ඇත්තෙන්ම මට කාරණා 03ක් සම්බන්ධයෙන් කතා කරන්න තියෙනවා. එකක් තමයි මහවලතැන්න කොට්ඨාශයේ ඉඹුලමුර වසමේ මහරත්යාය වෙල්යාය සඳහා හියුම් පයිප්ප ඉල්ලලා ගොවි සංවිධානයෙන් ලියුමක් දුන්නා. ඒ අනුව අපිට හියුම් පයිප්ප 02ක් ලබා දුන්නා. ඒ වෙනුවෙන් ස්තුතිවන්ත වෙනවා. අනික් කාරණාව තමයි වනඅලි තර්ජනය තිබෙනවා මේ ප්‍රදේශයට. ඉතින් පහුගිය කාලයේ ජීවිත 03ක් අපිට අහිමි වෙන්න තිබුණා. ඉතින් ඔවුන් අනූ නවයෙන් බේරුණා අලි ප්‍රහාරයකට ලක්වෙලා. ඉතින් පහුගිය කෘෂිකර්ම කමිටුවේදී යෝජනාවක් ගෙනාවා සැර අලියෙක් ඉන්නවා කියලා ඌ මෙහෙන් අරන් යනවා කියලා. ඉතින් තාම ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන නැහැ. ඉතින් ඒ සඳහා අවධානය යොමු කරන්න කියලා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අනිත් කාරණාව තමයි අපගේ ඉඹුලමුර මහවලතැන්න මාර්ගයේ හුණුකොටුව දක්වා මාර්ගය දෙපැත්ත එළිපෙහෙළි කළා. කොන්ත්‍රාත්කරුවෙක් විසින් කොන්ත්‍රාත් දීලා. නමුත් ඒක දැන් මග හැරිලා

තියෙනවා. මොකද කොන්ත්‍රාත්කරු හදිසියේම මිය යාම නිසා. ඉතින් ඒනිසා දැන් වාහන දෙකක්වත් මාරු කර ගන්න බැරි තත්ත්වෙට පත් වෙලා තියෙනවා. ඉතින් ඒ සඳහාත් අවධානය යොමු කරන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම අපි සියළු දෙනාගේම අදහසක් තියෙනවා අපිට දැන් මෙතන අදහසක් ඉදිරිපත් කරන්න විනාඩි 03ක් මදි ඇත්තම ගත්තම. තව විනාඩි 02ක් වත් අපේ සභිකවරුන්ට ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරමින් මගේ කතාව අවසන් කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය</u>**

ගරු සභාපතිතුමාගෙන්ද, අපේ සියළුම මන්ත්‍රීතුමන්ලා තුමියන්ලාගෙන්ද, ඒ වගේම ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන්ද, මාධ්‍යවේදී මහත්වරුන්ගෙන්ද අවසරයි. මම කතා කරන්න බලාපොරොත්තු වෙනවා සභාපතිතුමා අපි සභාවට ඇවිල්ලා යම් කිසි කාලයක් ගත වුණා. අපේ ගම්වල යම් සංවර්ධන වැඩසටහන් කිහිපයක් කළා. ඇත්තටම හදවතින්ම ඒ ගැන සතුටුයි. ඒ වගේම තමයි අපේ රටට බලපාපු දිට්යා සුළි කුණාටුව හමුවේ ඔබතුමන්ලාත් අපිත් රට ගොඩනැගීම සඳහා විශාල කාර්යයක් කළා. ඒ වගේම බළන්ගොඩ ප්‍රාදේශීය සභාව වශයෙන් මේ සභාවත් විශාල වැඩ කොටසක් කළා. අපිට යෝධ ශක්තියක් වුණු අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාත් මේ අවස්ථාවේ මතක් කරන්න ඕනි. විටෙකදි හිතතෙනවා එතුමා බිමේ ජීවත් වෙන නායකයෙක් විදියට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ද කියලත් අපිට හිතා ගන්න බැරි තරම් ජනතාවත් එක්ක සමීපව කටයුතු කරනවා. අපේ ඉඳුනිල් ප්‍රියන්ත මන්ත්‍රීතුමා වන අලි ගැටලුව ගැන කතා කළා. මන්ත්‍රීතුමනි, අපි පහුගිය පහළොස්වෙනිදා වටවල ශ්‍රමදානයක් පැවැත්වුවා. ඒ ශ්‍රමදානය ඉතාමත් සාර්ථක වුණා. වසම්වලින් ගොඩක් ජනතාව සම්බන්ධ වුණා. මං හිතන්නේ වසර කිහිපයකට වැඩි කාලයක් පැවති ගැටලුවකට කිසිම වියදමක් නැතුව ශ්‍රම දායකත්වයෙන් රටේ ඉදිවන එකම අලි වැට කිව්වොත් මං හිතන විදියට. අපි අලි පළවා හැරීමේ මෙහෙයුමත් මැතකදී සිදු කරනවා. කාන්තාවක් වශයෙන් අධ්‍යාපනය ගැන කතා කරනකොට මොහොතක් හිතන්න. අපි විදේශ රටවල ගියාම විභාග ලියන්නේ නැහැ. එවෙලේ විභාග ලියලා එවෙලේ ප්‍රථිපලේ බලන්නේ. නමුත් අපේ අධ්‍යාපනයේ තියෙන්නේ අපි රජයෙන් ගත්ත ඩෙස්ක් එකක විභාග ලියලා මාස ගණනක් ගිහින් තමයි ප්‍රථිපලේ බලන්නේ. ඔන්න අපේ රටේ තියෙන අධ්‍යාපනය. නමුත් අපි බලාපොරොත්තු වෙන රට ලස්සන අනාගතයක් පොහොසත් රටක් අපේ දරුවන්ට තියෙන රටක් හදා ගන්න තමයි අපේ මේ වෑයම. ඉතින් ලස්සනට තියෙන රටක් බිහි කරගන්න ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලනවා. ස්තුතිය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.ඩී.රෝෂන් ක්‍රිස්ටි මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, අපි විපක්ෂයක් හැටියට හැමවෙලේම සහයෝගය ලබා දුන්නා සහය දුන්නා හැමදේකදිම. උදාහරණයක් විදියට අයවැයට , ඔබතුමාට පෞද්ගලික ලේකම්තුමෙක් ඕනි කියනකොට , වියදම් අඩු කර ගන්න අවස්ථාව ඔබතුමාලා ළඟ තියෙද්දිත් අපි ඒකට අවස්ථාව දුන්නා අපි විරුද්ධ වුණේ නැහැ. හිටපු සභාපතිතුමාලා එහෙම මං හිතන්නේ ඉස්සර ලේකම්ලාපත් කර ගත්තේ නැහැ මං හිතන්නේ. හැමදේටම අපි සහයෝගය ලබා දෙනවා. නමුත් අර විනාඩි 03ට අඩු කිරීම පිළිබඳව නැවත වතාවක් හිතන්න කියලා කියනවා. මොකද මේ අපට දෙන අවස්ථාව මේක විතරයි. අපිට සම්බන්ධීකරණයටත් ආරාධනා කරන්නේ නැහැ. ඊට පස්සේ ගමේ ඔය තියෙන කමිටු එකකටවත් ආරාධනා කරන්නේ නැහැ. ඒක දේශපාලනීකරණය නෙවෙයි කියන්න විදියක් නැහැ මොකද ඒ ප්‍රජාව වෙනුවෙන් නම් කරන්නේ දේශපාලන අධිකාරිය මං දන්න විදියට. ඒක කොහොමත්ම කියන්න විදියක් නැහැ දේශපාලනය නැහැ කියලා. දැන් අපි යෝජනාවක් දුන්නට වැඩක් වෙන්නේ නැහැ. මොකද ඒගොල්ලෝ අයින් කරයි. අපි ඒ කමිටුවේ නැනේ. ඒ හින්දා ඒ ගැන හොඳට කල්පනා කරන්න. ඒ එක්කම ඔබතුමා වේලාසනින් කිව්වා විදුලි බල්බ අලුතින් දෙන්නේ නැ තියන ටික හරියට හදාගෙන යනවා කියලා. මේ වෙනකන් නම් හැබැයි ඒ පැත්තේ ටික තාම හදලා නෑ. ඒ ව්‍යාපෘතිය අවසන්ද දන්නේ නැහැ. ඒ පැත්තේ එක විදුලි බුබුලක්වත් හැදුවේ නැහැ. අනික් පැතිවල වුණත් සමහර අයගේ නැහැ. ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න. අර මතුවෙච්චි කාරණාවලට පිළිතුරු නොදී ඉන්නත් බෑ. මොකද දන්නවද අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලදි අපි නෙවෙයි ජනාධිපතිතුමයි තීරණේ ගත්තේ ඒක නවත්වන්න. ඔබතුමන්ලා ඒක කියන්න ජනාධිපතිතුමාට ඒක ක්‍රියාත්මක කරන්න කියලා අර ටික අයින් කරලා. ඒක නිසා සභාවේ අරකට පිළිතුරක් නොදී බැරි හින්දයි ඒක කියන්නේ. ඒ වගේ කරුණු කීපයක් තියෙනවා දැන් ඉතින් අනු කමිටුවකට ගෙන්නලා තියෙනවා අපි මේ සැරේ සම්බන්ධීකරණේ. ඔක්කොම කමිටු ටික ඉවර කරලා අනු කමිටුවට අපිට එන්න කියනවා. එහෙම ඕනි නෑ. ඒකත් ඕනි නම් ඒගොල්ලන්ටම අවස්ථාව ලබා

දෙන්න ඒකත් හොඳයි. දැන් සම්බන්ධීකරණෙට බස් ගැටලුවක් දැම්මා. ඒකට මොනවද වුණේ කියලවත් දන්නේ නැහැ.මම සම්බන්ධීකරණෙට ඒ ලිපිය යොමු කළා. ඒකට මොනවද වුණේ කියලා දන්නෙවත් නැහැ. මන්ත්‍රීවරු නම් කරලා තියෙන්නේ ඒ ගම ගැන කතා කරන්න. ඒ අවස්ථාව අපිට නැත්තම් වැඩක් නෑ. මේකේ කාලයක් යනකොට කියයිද දන්නේ නැහැ සභාව තියලත් වැඩක් නැහැ කියලා පක්ෂෙ කට්ටිය එකතු වෙලා තීන්දුවක් ගනියිද දන්නේ නැහැ සභාවට. එහෙම වැඩ කරන්නේ නැතුව හොඳ ක්‍රියාමාර්ග ගන්න කියලා ඉල්ලනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>**

සභාපතිතුමා මේ පොඩි දෙයක් කියන්නේ. පෞද්ගලික අදහස් දක්වනකොට මම දෙපාර්ශවය ගැනම අවධානයෙන් හිටියා. මොකද මේක යම් ලිඛිත නීතියක් අනුව ආණ්ඩුකාරතුමාගේ හා ඒ කොමසාරිස්වරුන්ගේ අනු දැනුම අනුව තමයි මේ පළාත් පාලන ආයතන පවත්වාගෙන යන්නේ. මං දැක්කා චතුරිකා මිස් දෙනවා ඔබතුමාට. දැන් එතකොට පෞද්ගලික අදහස් දක්වන කොට ගරු සභාපතිතුමා එක්කෝ සභාව පටන් ගන්න කලින් ඒ පෞද්ගලික අදහස ඔබතුමා ලිඛිතව ලියලා දෙන්න ඕනි මං මෙන්න මේ කාරණය ගැන තමයි කතා කරන්නේ කියලා එහෙම නැත්තම් ඒ අවස්ථාව බලලා කතා කරන්න පුළුවන්. දැන් සමහර මන්ත්‍රීවරු කිව්වා විනාඩි 03 ක් මදි කියලා. අපිට විනාඩි 05ට මේ ගරු සභාවේ සම්මත කරලා ඒක කර ගන්න පුළුවන්. එතකොට මේක විනයානුකූලව පවත්වාගෙන යන්න ගරු සභාපතිතුමා අපේ පක්ෂෙන් අපිට ලියලා දෙන ලිපියක් කටපාඩම් කරලා කියවලා හරි , ඔබතුමාගේ පක්ෂෙන් ලියලා දෙන දෙයක් කියවලා හරි මේකේ අර මතභේදාත්මක අපහැදිලිතා ඇති නොවන පරිදි හරියට මේ පනත් කියවලා බලලා අවබෝධයෙන් යුතුව, අපේ පැත්තෙනුත් පොඩි පොඩි යම් යම් වැරදි තිබුණා, ඔබතුමන්ලගේ පැත්තෙනුත් යම් යම් වැරදි තිබුණා මින් ඉදිරියට පෞද්ගලික අදහස් දක්වනකොට හරියට මේ පනත පරිහරණය කරලා ඒකට අනුව ගියානම් මේ කිසිම ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. අපි යෝජනාවක් දාලා ලබන පාර ඉඳන් හරියට කර ගෙන යමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමා</u>**

ගරු සභාපතිතුමාගෙන්ද, සහෝදර සියලු මන්ත්‍රීතුමන්ලාගෙන්ද, ලේකම්තුමියගෙන්ද මාධ්‍යවේදී සහෝදරවරුන්ගෙන්ද අවසරයි. මම ගිය සභා වාරයේදී වන අලි ගැටලුව ගැන කතා කළා. මොකද වන අලි තර්ජනය අපේ වසම් ගාණක් ආවරණය වෙන විදියට තියෙන නිසා. ඒකට අපි 2017 වර්ෂයේ සිට කර ගැනීමට නොහැකි වුණු ගැටලුවක් විසඳා ගැනීමට අපි සමත් වුණා. ඒ ගැන මං මගේ සතුට මුලින්ම ප්‍රකාශ කරනවා. මොකද එහෙම කියන්න හේතුව මම ගිය සභා වාරයේ කතා කරලා කිව්වා අපි 15 වෙනිදා පටන් ගන්නවා වැඩ පිළිවෙලක්. මොකද විදුලි වැට සකස් කරන්න. ඒ කියන්නේ වන අලින්ගේ තර්ජනය සියයට සියයක්ම නවත්වන්න බෑ ඒ විදුලි වැටෙන්. ඒක අපි ඔක්කොම දන්නවා. සියයට අසූපහක් විතර සාර්ථක වැඩපිළිවෙලක්. අපිට මේක 2017 ඉඳන් සම්බන්ධීකරණයක් කරගන්න බැරිවෙලා හිටියේ. මේ ආයතන 05ම ඒකාබද්ධ වෙලා මේ කරන වැඩේ සම්බන්ධීකරණය කර ගන්න බැරුව අපිට වසර 08ක කාලයක් ගත වුණා. නමුත් දින 08ක් වැනි කෙටි කාලසීමාවක් තුළදී අපි මේකේ සම්බන්ධීකරණය හදා ගෙන , ආයතන සියල්ල එකතු කරගෙන සාර්ථකව ඒ වැඩේ අවසන් කරලා මේ වෙනකොට වනජීවි දෙපාර්තමේන්තුවට භාර දීලා තියෙනවා එයාලගේ ඉතුරු කටයුතු සඳහා. ඒ සඳහා අපේ විශේෂ සම්බන්ධීකරණය හඳලා දුන්නා අපේ රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී , සම්බන්ධීකරණ කමිටු සභාපති වසන්ත පුෂ්පකුමාර සහෝදරයා. එතුමාට විශේෂ ස්තූතියක් මේ අවස්ථාවේ පුද කරනවා. ඒ වගේම ඒ අවස්ථාවට මගේ සුහඳ ඇරයුමට වසම් වලින් දින කීපයක් සහභාගී වීම් සිදු වුණා. විශේෂයෙන් මහවලතැන්න වසමේ රුමේෂ් නයනජිත් මන්ත්‍රීතුමා අපිට තේ පැන් සංග්‍රහයක් සඳහා හිටන් ආධාර දුන්නා. ඒ වගේම ඉඹුලමුර වසමේ ග්‍රාම නිළධාරිතුමියට විශේෂ ස්තූතියක් පුද කරන්න ඕනි මේ අවස්ථාවේ. එතුමියත් පිරිස සහභාගී කෙරෙව්වා. ඒ වගේම නම් කියන්න අමතක වෙලත් ඇති , ඊට අමතරව අපි මේකට හදපු සැලැස්ම තමයි සෑම නිවසකින්ම එක් අයෙක් සහභාගී වෙන්න කියලා. එක් ශ්‍රමිකයෙක් එක් දිනක්. අපි දින 08ක් තුළදි ශ්‍රමිකයන් 10 දෙනෙක් යොදා ගෙන අලිවැට සාර්ථකව අවසන් කළා සභාපතිතුමනි. ඒ එක්කම අලි තර්ජන තියෙනවා මේ වසම් ගාණකටම. මං දන්නා තරමින් වන අලින් 07 දෙනෙක් පමණ තමයි මේ ගම්වැදිලා ඉන්නේ. ඒ කණ්ඩායම තමයි මේ හැම තැනම සැරිසරන්නේ. මේ වන විට අපි වන ජීවි දෙපාර්තමේන්තුව සහ අපේ සම්බන්ධීකරණ කාර්යාලය එකතුවෙලා වනජීවි මූලස්ථානයට ලිපි ඉදිරිපත් කරලා තියෙනවා අලිවැට අවසන් කියලා. තව දවස් 02ක් 03ක් යනකොට

බොහෝවිට අවසන් වෙනවා. ඒ අවසන් වුණාට පස්සේ අලි පළවා හැරීමේ මෙහෙයුමක් ක්‍රියාත්මක කරනවා. ඒක ක්‍රියාත්මක කරන්න අපිට ලොකු ක්‍රමවේදයක් තියෙනවා. ඒකට අවසර ඉල්ලලා ලිපි ඉදිරිපත් කරලා තියෙනවා මේ වෙකොටත්. ඒ ලියුම්වලට අනුමැතිය ලැබුණාට පස්සේ ඒකටත් සහයෝගය අනිවාර්යයයෙන් අවශ්‍ය වෙනවා. මොකද වන අලි පළවා හරිනවා කියන්නේ. ලොකු මෙහෙයුමක්. එකදවසින් දෙකෙන් අවසන් කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. මං හිත්නනේ එහෙම මෙහෙයුමක් කරන්න සතියකටත් වඩා වැඩි කාලයක් ගත වෙනවා. මොකද හතරබාගේ පැත්තෙන් ඉන්න අලි ටික සමනළ වැව වැටෙන් එහා පැත්තට දාන්න ඕනි. ඉඹුලමුර, මහවලතැන්න , මාවෙල, රජවක, තැන්න, මොලමුරේ ඉන්න වන අලි ටික පළවා තියෙනවා ඒ විදුලි වැටෙන් එහා පැත්තට. එතකොට ඒකටත් ලොකු කාලසීමාවක් යනවා. ඒ ක්‍රියාවළිය සිදුවන අවස්ථාවේ මම දැනුම් දෙන්න බලාපොරොත්තු වෙනවා. ඒකටත් සහයෝගය ලබා දෙන්න කියලා මම ඉල්ලනවා. ඒ වගේම මේ අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වන අතර මගේ කතාව අවසන් කරනවා.

<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>

අපිට මන්ත්‍රීතුමන්ලාගේ පෞද්ගලික අදහස් ඉදිරිපත් කිරීමේදී මතුවුණු කාරණා ටිකක් තියෙනවා. එකක් තමයි අර කල්තොට සම්බන්ධීකරණ කමිටුවේදී බස් ප්‍රශ්නයක් ගැන කතා කළා. ගරු මන්ත්‍රීතුමා මේ 13 වෙනිදා දහවල් 1.30ට කල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මේ සාකච්ඡාව තියෙනවා. ඒකට අදාළ සියලුම මන්ත්‍රීතුමන්ලාට සහ තුමියන්ලාටත්, රජයේ නිළධාරින්ටත් ලිපි යවලා තියෙනවා. ඒ කියන්නේ ඔබතුමාට ඒකට ලිපිය ලැබුණේ නැත්තම් 13 වෙනිදා දහවල් 1.30ට කල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට එන්න. ඊළගට තව මතු වෙච්ච කාරණයක් තියෙනවා ඇත්තටම මන්ත්‍රීවරුන්ට අදහස් ඉදිරිපත් කිරීමට සීමිත කාලයක් තියෙන්නේ. ඒක නිසා සම්බන්ධීකරණ කමිටුවටවත් සම්බන්ධ වෙන්න බැරි වෙනවා. ඒක නිසා අපි ඒකට මෙහෙම වැඩපිළිවෙලක් හදා ගන්නවා. දැන් මගේ දකුණු අත පැත්තේ ඉන්න මන්ත්‍රීතුමන්ලාත් හැමදාම යන්නේ එකම දෙන්නා නෙවෙයි. අනිත් අය ඉල්ලීමක් කළොත් අර දෙන්නා නතර කරලා වෙන දෙන්නෙකුට අවස්ථාව ලබා දෙනවා. දැන් මේ සැරේ තියෙන සම්බන්ධීකරණ කමිටුවට ඉක්බාර් මන්ත්‍රීතුමා යන එක වැදගත් කියලා හිතුණා අර ප්‍රජා පොලිස් ප්‍රශ්නෙත් එක්ක. එතකොට අපි ඒක මතු කළාට පස්සේ එතන කතා කරන්න පුළුවන්. මොකද මෙතන අසාධාරණයක්නේ වෙලා තියෙන්නේ. එතන ඒ සම්බන්ධීකරණ කමිටුවේ සීමා කරලා තියෙන්නෙම අපිට රාජ්‍ය නිළධාරින් තමයි මේතනට ගේන්න ඕනිම. රාජ්‍ය නිළධාරින්ගෙන් තමයි අපිට ප්‍රශ්න කරන්න ඕනි. ගැටලු විසඳගන්න තියෙන්නේ. දැන් බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හෝල් එක ගත්තොත් පොඩියි. කල්තොට ගත්තොත් එහෙමවත් නෑ. දැවැන්ත මුදලක් වියදම් කරලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් හදමින් ඉන්නේ. හැදුවට පස්සේ අපිට සම්මන්ත්‍රණ ශාලාවක් තියෙයි. ඒකෙදි අර හේතුව නිසා තමයි සීමා කරලා තියෙන්නේ. ඒක නිසා අපෙන් තමයි ඉල්ලන්නේ . එහෙම ඉල්ලුවම ගරුමන්ත්‍රීතුමන්ලත් එක්ක කතා කරලා දාලා දෙන්නම්. දැන් ගරු මලිත් මන්ත්‍රීතුමා තමයි දාලා තියෙන්නේ. ඇත්තටම ගැටලු තියෙන්නේ අපිට. ගැටලු තියෙන කෙනා තමයි එතනට යන්න ඕනි. ඊට පස්සේ අර මහවලතැන්නේ අලි ප්‍රශ්නේ තියෙනවා. ඒකෙදී ප්‍රදීප් මන්ත්‍රීතුමා එහෙම මහන්සි වෙලා ශ්‍රමදාන එහෙම දාලා , අලිවැට අතරමග නතර කරලා දාලා තිබුණේ, ඇත්තටම මේක කෙරෙන්නෙම නැති මට්ටමක් තිබුණා , ඒකට ස්වෙච්ඡාවෙන් සියලු දෙනා මැදිහත් වෙලා , රාජ්‍ය නිළධාරින් , ඇත්තටම රාජ්‍ය නිළධාරින් හරියට මැදිහත් වුණා ඊට පස්සෙ ශ්‍රමදාන එහෙම දාලා වැඩේ කළා. මං ආරාධනා කරනවා ඔය වසම්වල ඉන්න අපේ සියලුම සභිකයින්ට ඒවට සම්බන්ධ වෙන්න කියලා.

ඒ අනුව මහා සභාවේ කටයුතු පෙ.ව.11.10ට අවසන් කරන ලදී.

ගමඇතිගේ ආරියදාස
සභාපති
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව